# නෝර්වේ සමග තානාපති සබඳකම් අත්හරිමු

නෝර්වේ රාජ්‍යය ලංකාව බෙලහීන, නිවට රාජ්‍යයක් ලෙස සලකන බව පෙනෙයි. නිවට කරණවෑමියා දුටු විට, එළුවා ද රැවුල පාන්නාක් මෙන් අද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ රටවල් ලංකාවට කෙණහිලිකම් කරනු දක්නට ඇත. ජිනීවා බලා ගිය කොටි සංවිධානයේ ත්‍රස්තවාදීන්ට එහිදී මුදල් එකතු කිරීම ප්‍රශ්නයක් නොවීය. ස්විට්සර්ලන්ත රජය ඒ සඳහා කොටින්ට අවසර දුනි. ස්විට්සර්ලන්තය අමුතුම ආකාරයේ රටක් බවද එය බොහෝ ජාත්‍යන්තර ගිවිසුම්වලට බැඳී නොමැති බවද මෙහිදී නිදහසට කරුණු වශයෙන් කිව හැකිය. එහෙත් අපට අවශ්‍යවන්නේ නිදහසට කරුණු නොව, ඒ ඒ රටවල වැඩ සිදුවෙමින් පවතින ආකාරයය. බොහෝ දෙනා පිළිගැනීමට මැළිකමක් දැක්වුවද, බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ රටවල් අපට විරුද්ධ වෙයි.

ලංකාව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ රටවල් අතර අද එතරම් ජනප්‍රිය නැත. ඔවුන්ට අවශ්‍ය කරන්නේ හැකි ඉක්මණින් ලංකාව ඇතුළු වෙනත් ආසියාතික හා අප්‍රිකානු රටවල් සංස්කෘතික වශයෙන් ක්‍රිස්තියානි බවට පත් කිරීමය. (දේශපාලන හා ආර්ථික වශයෙන් ඒ රටවල් බටහිර ක්‍රමය අනුගමනය කිරීමට සලස්වා ඇත්තේ කලක සිටය) ඒ සඳහා ඔවුහුවිවිධ උපක්‍රම යොදාගනිති. රාජ්‍ය නොවන සංවිධාන විසින් හා ඇතැම් සතිඅන්ත පත්තර කඩ මාළු ඇතුළු ජඩ මාධ්‍ය විසින් මූලික වශයෙන් කෙරෙන්නේද එවැනි කාර්යයකි. දෙමළ ජාතිවාදයට අනුග්‍රහ දක්වන්නේ නෝර්වේ පමණක් නොවේ. ඇමරිකා එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍යයද, කැනඩාවද ඕස්ට්‍රේලියාව ද එසේ කරන තවත් රටවල්ය.

ජිනීවා සාකච්ඡා අවසන් වූ වහාම තමිල් සෙල්වන් ඇතුළු කොටි ත්‍රස්තවාදීහු නෝර්වේ බලා ගියහ. එහිදී ඔවුන්ට ඉහළම පිළිගැනීමක් ලැබී ඇත. සාමාන්‍යයෙන් රාජ්‍ය නායකයන්ට ලැබෙන පිළිගැනීමක් ත්‍රස්තවාදීන්ට ලබාදුන් නෝර්වේ රාජ්‍යය ඉන්පසු කොටි නියෝජිතයන් ලංකාවට පැමිණෙන අවස්ථාවේදී ඔවුන් මුණගැසීමට මෙරට සිටින නෝර්වේ තානාපතිවරයා යැවීය. මේ සියල්ලෙන් පැහැදිලි කරන්නේ දැනටමත් නෝර්වේ රාජ්‍ය කොටි ත්‍රස්තවාදී නියෝජිතයන්ට රාජ්‍ය නියෝජිතයන්ට දෙන සැලකීම එලෙසම දෙන බවය. කොටි ඒ බව දනිති. කොටි ත්‍රස්තවාදීන් ඕනෑම කරුණකදී නෝර්වේ තානාපතිට හෝ සොල්හයිම්ට හෝ පැමිණිලි කරන්නේ තමන්ට ලැබෙන විශේෂ සැලකීම ගැන මනා අවබෝධයකින් යුක්තවය. ඒ අතර රනිල් වික්‍රමසිංහ මහතා ද නෝර්වේ බලා ගොස්ය. ඔහු එහි කරන්නේ කුමක් දැයි දන්නා අයකු නැත. එහෙත් මේ හදිසියේ ඔහු නෝර්වේ යන්නට ඇත්තේ රට බැලීමට නොවන බව නම් පැහැදිලිය. වෙනත් මොන කරුණක් ගැන රනිල් වික්‍රමසිංහ මහතාට එරෙහි වුවද මේ කරුණෙහිදී එස්. බී. දිසානායක, රාජිත සේනාරත්න වැනි අය ඔහුට විරුද්ධ නොවෙති. කවුරු පක්ෂ නායකයා වුවද එක්සත් ජාතික පක්ෂය බටහිර ක්‍රිස්තියානි යටත් විජිතවාදයේ සෘජු ඒජන්තයා වෙයි.

නෝර්වේ රාජ්‍යය තවදුරටත් ඊනියා සාම ක්‍රියාවලියෙහි මැදිහත්කරු ලෙස තබාගැනීම අප රටට තර්ජනයකි. කොටි ත්‍රස්තවාදීන්ට පක්ෂපාතී වූද, කොටි නියෝජිතයන්ට රාජ්‍ය නියෝජිතයන්ට සේ සලකන්නා වූද, විපක්ෂ නායකයා තම රටට ගෙන්වාගෙන දේශපාලන සාකච්ඡාවල යෙදෙන්නා වූද රාජ්‍යයක් අපට තර්ජනයක් බව අමුතුවෙන් කිවයුතු නොවෙයි. (රනිල් වික්‍රමසිංහ මහතා නෝර්වේහිදී කතා කරන්නේ එරට හා මෙරට කාලගුණය යැයි මොහොතකටවත් නොසිතිය යුතුයි.) නෝර්වේ රාජ්‍යයෙහි මේ ද්‍රෝහී ක්‍රියාමාර්ගය ගැන අප කතා කිරීමට පටන්ගත්තේ අද ඊයේ නොවෙයි. අවුරුදු දහයකටත් වැඩි කාලයක් තිස්සේ අපි ඒ සම්බන්ධයෙන් කීවෙමු. දැනට අවුරුදු දහයකට පෙර නෝර්වේ තානාපති කාර්යාලය ඉදිරිපිට අපි පිකට්ටුවක් පැවැත්වීමු. එයට අතිවිශාල පිරිසක් සහභාගි නොවූ බවද අමුතුවෙන් කිවයුතු නොවෙයි. බොහෝ දෙනාට එදා ඒ සම්බන්ධයෙන් කිසිදු දැනීමක් නොමැති විය. එහෙත් එදා ඒ සිද්ධිය රනිල් වික්‍රමසිංහ මහතාට සම්බන්ධ රූපවාහිනී නාලිකාවක් මගින් ප්‍රචාරය කෙරිනි. එය ප්‍රචාරය කළේ එයට සහභාගි වූ සංඛ්‍යාව අඩුවෙන් වාර්තා කරමින් අප හැල්ලුවට ලක් කරමින්ය. එදා ද රනිල් වික්‍රමසිංහ මහතා හා නෝර්වේ අතර සම්බන්ධයක් තිබුණි.

නෝර්වේ රාජ්‍යය ගැන තවදුරටත් බලා සිටීමට නොහැකිය. වහාම ඊනියා සාම ක්‍රියාවලියෙන් නෝර්වේ ඉවත් කළ යුතුය. ඇත්තටම කළ යුත්තේ නෝර්වේ රාජ්‍යය සමග ඇති සියලු තානාපති සම්බන්ධකම් අස්කර ගැනීමය. යම් හේතුවක් නිසා එසේ නොකරන්නේ නම් අඩුම තරමින් ඊනියා සාම ක්‍රියාවලියෙන් ඔවුන් ඉවත් කළයුතු වෙයි. ඒ අතර

සොල්හයිම් හා මෙරට නෝර්වේ තානාපති ආදීන් මෙරට රජයේ ගෞරවයට පාත්‍ර නොවූ මෙරටට අවශ්‍ය නොවන පුද්ගලයන් ලෙස නම් කළ යුතුවෙයි. එහෙත් අප අමතක නොකළ යුතු කරුණක් වෙයි. එනම් දෙමළ කොටි ත්‍රස්තවාදීන්ට පක්ෂපාතීත්වය දක්වන්නේ නෝර්වේ පමණක් නොවන බවය. ඉහත සඳහන් කෙරී ඇති රටවලට අමතරව ස්වීඩනය, නෙදර්ලන්තය ආදී රටවල් ද කොටි ත්‍රස්තවාදීන්ට පක්ෂ වෙයි. ආනන්ද සංගරී මහතා ද නෝර්වේ රාජ්‍ය කොටින්ට පක්ෂපාති බව පවසයි. නෝර්වේ ඊනියා සාම ක්‍රියවලියෙන් ඉවත් කිරීමට ඒ මහතා ද විරුද්ධ නොවනු ඇත. එපමණක් නොව කොටි විරෝධී අනෙක් දෙමළ ජනයා ද ඊනියා සාම ක්‍රියාවලියෙන් කොටි ඉවත් කිරීමට විරුද්ධ නොවනු ඇත. එහෙත් අද ද ආනන්ද සංගරී මහතා තවමත් පැරණි ෆෙඩරල් ප්‍රතිපත්තියෙහි සිටියි. පසුගියදා ජනතා විමුක්ති පෙරමුණට ලිපියක් යවමින් ඒ මහතා ඒ පක්ෂයෙන් ඉල්ලා ඇත්තේ ඒකීය ප්‍රතිපත්තිය වෙනස් කර ගන්නා ලෙසය. අප ඒ මහතාගෙන් ඉල්ලා සිටින්නේ ෆෙඩරල් ප්‍රතිපත්තියෙන් ඉවත් වන ලෙසය. රටක ජනවාර්ගික පදනමක් මත ෆෙඩරල් හෙවත් සන්ධීය රාජ්‍යයක් ඇති කරන්නේ නම් අනිවාර්ය එහෙත් ප්‍රමාණවත් නොවන අවශ්‍යතාවක් වෙයි. එනම් ඒ රටේ ජනගහනයෙන් යම් ජනවර්ගයකට අයත් පිරිසෙන් ඉතා විශාල ප්‍රමාණයක් යම් නිශ්චිත භූමියක විසීමත්, ඒ නිශ්චිත භූමියෙහි වාසය කරන්නන්ගෙන් ඉතා විශාල ප්‍රමාණයක් එකී ජනවර්ගයට අයත්වීමත්ය. ඉන්දියාවේ මේ අවශ්‍යතාව සපුරාලී ඇත. උදාහරණයක් ලෙස ගතහොත් එරට වසන දෙමළ ජනයාගෙන් ඉතා විශාල ප්‍රමාණයක් වාසය කරන්නේ තමිල්නාඩුවෙහිය. එමෙන්ම තමිල්නාඩුවෙහි වාසය කරන ජනයාගෙන් අතිමහත් බහුතරය දෙමළ වෙයි.

එහෙත් ලංකාවේ තත්ත්වය එසේ නොවෙයි. ලංකාවේ දෙමළ ජනයාගෙන් බහුතරය, සියයට හැටකට වැඩි පිරිසක් වාසය කරන්නේ උතුරු හා නැගෙනහිර පළාත්වලින් පිටතය. එමෙන්ම ඒ පළාත්වල වාසය කරන ජනයාගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් දෙමළ නොවෙයි. දෙමළ ජනයාට ඇතැයි කියන ඊනියා ප්‍රශ්න හේතු කොටගෙන ඒ පළාත්වල වෙනම ප්‍රාන්තයක් වන ලෙස සන්ධීය රාජ්‍යයක් ඇති කළද, අනෙක් පළාත්වල වාසය කරන අතිමහත් දෙමළ ජනයාට ඇතැයි කියන ප්‍රශ්නවලට විසඳුමක් එසේ සන්ධීය රාජ්‍යයක් බිහිකිරීමෙන් නොලැබෙයි. පසුගිය දා මනෝ ගනේෂන් මහතා ඇතුළු පිරිසක් බස්නාහිර පළාතේ දෙමළ ජනයාගේ සංවිධානයක් පිහිටුවාගත්හ. ඔවුන් කියන්නේ බස්නාහිර පළාතේ දෙමළ ජනයාට විශේෂිත වූ ප්‍රශ්න ඇති බවය. ඒ අතර කරුණා නැගෙනහිර පළාතේ දෙමළ ජනයා වෙනුවෙන්ද තොන්ඩමන් කඳුකරයේ දෙමළ ජනයා වෙනුවෙන්ද කතා කරති. ඔවුන්ගේ ඊනියා ප්‍රශ්න වෙනුවෙන් අප බස්නාහිර පළාතේ වෙනම සන්ධීය ප්‍රාන්තයක් හා කඳුකරයේ වෙනම ප්‍රාන්තයක් පිහිටුවන්නේ ද? ලංකාවේ දෙමළ ජනයා සජාතීය නොවන අතර ඉහත සඳහන් අනිවාර්ය අවශ්‍යතාද නොසැපිරෙයි. ආනන්ද සංගරී මහතා කරුණු තේරුම්ගෙන එකසේසත් රාජ්‍යයකට කැමතිවනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

ඉතා පැහැදිලිව කොටි ත්‍රස්තවාදීන්ට පක්ෂපාත වී ඇත්තේ බටහිර රෙපරමාදු ක්‍රිස්තියානි රටවල් ය. අද ලෝක ආධිපත්‍යය දරන්නේ ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ මේ රටවල්ය. මේ ක්‍රිස්තියානි රටවල් කතෝලික සංස්කෘතියට ද බලවත් තර්ජනයක් වෙයි. බටහිර ක්‍රිස්තියානි උපත ලැබුවේ කතෝලික සංස්කෘතියට එරෙහිවය. මේ රටවල්වල සම්භවය ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහිය. අද බ්‍රිතාන්‍යය ද ක්‍රියාකරන්නේ කොටි ත්‍රස්තවාදීන්ට පක්ෂව ය. විශේෂයෙන්ම මධ්‍යස්ථභාවයක සළුපිළි පොරවාගෙන සිටින බීබීසීය වැනි ආයතන ප්‍රවෘත්ති ප්‍රචාරයෙහිදීද වෙනත් වැඩසටහන් සම්පාදනයෙහිදී ද කොටින්ට පක්ෂපාත වෙයි. බීබීසීය කෙදිනකවත් කොටි ත්‍රස්තවාදය ඒ නමින් නොහඳුන්වයි. කොටි සිදුකරන අපරාධ ගැන කොටින්ට දොස් නොපවරයි. ප්‍රභාකරන් මිනීමරුවෙකු යුද අපරාධකරුවකු ලෙස හඳුනා නොගනියි. එහෙත් ඒ බීබීසීයම සදාම් හුසේන්, බින් ලාඩන්, පසුගියදා සැකටයුතු ආකාරයකට මියගිය මිලොසෙවික් ආදීන් හඳුන්වන්නේ දරුණු අපරාධකරුවන් ලෙසය. ලෝකයේ අනෙකුත් ජඩ මාධ්‍යවල මව සැබවින්ම බීබීසීය වෙයි. අද මෙරට පමණක් නොව ලෝකයේ අනෙක් රටවලද සිදුවන්නේ කුමක්දැයි තේරුම් ගැනීමේදී අපට අපේ ප්‍රවාද අවශ්‍ය වෙයි. එසේ නැතහොත් අපට ලෝකය තේරුම්ගැනීමට සිදුවන්නේ බටහිර ක්‍රිස්තියානි රටවල නිර්මාණය කෙරෙන ප්‍රවාද ඇතුළු දැනුම්වලට පෙනෙන ආකාරයට ය. එබැවින් අපි ඉඩ ලැබෙන පරිදි බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පිළිබඳ අපේ ප්‍රවාද ඉදිරිපත් කරමු..................

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva